" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

SLSI ISO 9001 SYSTEM CERTIFIED

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.11.25 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/12/8/19 හා 2021.11.24 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.10.07 MH/TA/G/PSM/05/2020 | කොවිඩ් 19වසංගත කාල සීමාවේදී ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල නිරත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අතිකාල දීමනා ලබා දීම. |
| 02 | 2021.10.07 01-33/2021 | 1997.01.01 දිනෙන් පසු විශ්‍රාම ගිය ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් නොලැබීම. |
| 03 | 2021.10.05 02-75/2021 | ශ්‍රී ලංකා හෙද සේවයේ ශ්‍රේණිගත උසස්වීම් සඳහා සලකා බලනු ලබන කාලසීමාව සංශෝධනය කිරීම. |
| 04 | 2020.01.17 01-07/2020 | මහජන සෞඛ්‍ය හෙද සොයුරියන් සහ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් (ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම්)සඳහා වූ මාසික බිල්පත් නිරවුල් කිරීමට අනුමැතිය ලබා දීම. |
| 05 | 2021.05.21 09/2021 (රා.ප. චක්‍රලේඛයකි) | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම. |
| 06 | 2021.06.30 14/2021 (රා.ප. චක්‍රලේඛයකි) | ජාතික ක්‍රීඩා දිනය ප්‍රකාශයට පත් කිරීම. |
| 07 | 2021.10.22 02/2021 (රා.ප. චක්‍රලේඛයකි) | කොවිඩ් 19 ආසාධිත රජයේ නිලධරයන් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම. |

| | | |
|---|---|---|
| 08 | 2021.11.05<br>23/2021<br>(රා.ප. චක්‍රලේඛයකි) | රාජ්‍ය ආයතනවල නිලධරයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත "ඉ-ග්‍රාම නිලධාරි " පද්ධතියට ඇතුලත් කිරීම. |

**02.** එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2021

මගේ අංකය : EST-6/04/INS/1010
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.10.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**කොවිඩ් - 19 ආසාදිත රජයේ නිලධරයන් සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ගෙවීම**

කොවිඩ්-19 ආසාදිත වූ රජයේ නිලධරයන්ට අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ හිමිවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන විමසීම් ආයතන ප්‍රධානීන් වෙතින් මෙන් ම රාජ්‍ය නිලධරයන් වෙතින් ද මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වී ඇත. ඒ පිළිබඳව අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් කරන ලද විමසීමට අනුව, ප්‍රතිකාර ලබා ගන්නා ආකාරය සැලකිල්ලට ගෙන කොවිඩ් - 19 ආසාදිත ව ප්‍රතිකාර ගන්නා රාජ්‍ය නිලධරයන්ට අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කරනු ලබන බව දැනුම් දී ඇත.

02. ඒ අනුව, ගෙවනු ලබන ප්‍රතිලාභ, ප්‍රතිලාභ ගෙවනු ලබන ක්‍රමවේදය, ඒ සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍යවන ලියවිලි ඇතුළු අනෙකුත් විධිවිධාන පිළිබඳව තොරතුරු, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි නිල වෙබ් අඩවියට (www.nitf.lk) පිවිසීමෙන් ලබා ගත හැකි ය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය